# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 පෙබරවාරි මස 07 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.40 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා | ජගත් කුමාර | රවීන්ද්‍ර යසස් කුමානායක |
| අනුරාධ විමලරත්න | ජනක දීපාල් වැලිවත්ත | රොජර් සෙනෙවිරත්න |
| අනුරුද්ධ ලේකම්ගේ | ජයන්ත ද සිල්වා | රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර් |
| අසෝක රන්වල | ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර | රොයිස් විජිත |
| අශෝක දයාරත්න | තුවාන් ආමිත් මොහමඩ් අක්රම් | රෝස් ප්‍රනාන්දු මෙනෙවිය |
| අමල් සිල්වා | තෙබුවන පියනන්ද හිමි | ලක්ෂ්මන් නිපුණ ආරච්චි |
| අර්ෂාඩ් නිසාම්ඩීන් | නිමල් ආර්. පීරිස් | ලලන්ත ගුණසේකර |
| ඉන්දික බණ්ඩාර | නිමල් චන්ද්‍රරත්න | ලලිත් එල්ලාවල |
| ඊ.ඒ. නන්දන පත්මකුමාර | නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන | ලලිත් වර්ණකුමාර |
| උදාර රත්නායක | නිරෝෂන් පාදුක්ක | ලෙනාඩ් කරුණාරත්න |
| උදේන විජේරත්න | නිරෝෂා අතුකෝරල මැතිනිය | සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය |
| උපාලි කොඩිකාර | නිශාන්ත ශ්‍රී වර්ණසිංහ | සරත් පතිරණ |
| උපාලි ගුණරත්න | නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු | සලෝචන ගමගේ |
| උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ | පී.ආර්.පී. අබේගුණවර්ධන | සහන් ප්‍රදීප් |
| එම්.එස්.එම්. රහීම් | පී.ඩී. අබේරත්න | සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා |
| එස්. කුහවරදන් | ප්‍රදීප් උඩුගොඩ | සුනිල් වටගල |
| එස්.එම්. සකාවුල්ලා | බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන | සුමිත් විජයමුණි ද සොයිසා |
| ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව | මහේෂ් අල්මේදා | සුසාර දිනාල් |
| කිත්සිරි කහටපිටිය | මංජුල ප්‍රසන්න සම්පත් | සුසිල් කිඳෙල්පිටිය |
| කීර්ති කාරියවසම් | මංජුල බුද්ධදාස | සෙනල් වෙල්ගම |
| කුරුසාමි කලන්කාඩි තේවර් | මෙරිල් පෙරේරා | සේනක දමයන්ත ද සිල්වා |
| කේ.ඩී. අරුණ දීපාල් | මොරිස් විජේරත්න | ශිරන්ත අමරසේකර |
| කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය | මොහොමඩ් ෆයිරූස් | හරිස්චන්ද්‍ර කොස්තා |
| චන්දන ජයකොඩි | යූ.එල්.එන්.පී. උඩවෙල | හෙක්ටර් බෙත්මගේ |
| ජගත් අංගගේ | රජිත හපුආරච්චිගේ | |

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| ඇන්ටනී උපුල් රාජිත | ජගත් පී. විතාන | රන්දීර් රොද්‍රිගෝ |
| ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා | ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා | රවී විජේසේකර |
| ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් | නව්සර් ෆව්සි | ලයනල් ජයසිංහ |
| එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය | ප්‍රදීප් පෙරේරා | විජිත් ප්‍රියන්ත |
| කාමල් කුරුප්පු | මල්ෂා කුමාරණතුංග මැතිනිය | ශ්‍රීනාත් පෙරේරා |
| කොලන්නගේ වජිර පෙරේරා | මහින්ද ජයසිංහ | |
| ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා | මොහොමඩ් ෆායිස් | |

## 01. **විගණකාධිපති වාර්තාව : 2015**

බස්නාහිර පළාත් සභාවේ 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***එකී විගණකාධිපති වාර්තාව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමුකරන ලදී.***

## 02. **කාරක සභා වාර්තා :**

ගරු සභාපතිතුමා විසින් 2017.01.17 හා 2017.01.18 දිනවල පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ වාර්තාවන් පිළිගන්වන ලදී.

## 03. **නොපැමිණ සිටීමේ අවසරය :**

*ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාට මාසයක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි" ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.*

*"විජිත් ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි" යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.*

*"තුෂාර පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි" මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.*

**කාර්ය සටහන් නිවැරදි කිරීම :**

මොහොමඩ් ෆායිස් ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක් නිවාඩු අනුමත කරන ලෙස ගුණසිරි ජයනාත්, ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් 2017.01.17 දින රැස්වීමේදී කරන ලද යෝජනාව සභා සම්මත වූ අතර, එය එදින නිල වාර්තාවේ සඳහන් වන නමුත් එය එදින කාර්ය සටහන්වලට ද ඇතුළත් වීමෙන් නිවැරදි විය යුතුය.

## 04. **තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය : දෙවන වර කියවීම**

*"2016 අංක .... දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය" දෙවනවර කියැවීම සඳහා රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, 2016.11.08 හා 2016.11.22 දිනයන්හි ප්‍රඥප්ති හා නීති කාරක සභා වාර්තාවන්හි සඳහන් සංශෝධනයන්ට යටත්ව ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

## 05. **තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය : තෙවන වර කියවීම**

*රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා විසින් "2016 අංක .... දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය" තෙවනවර කියැවීම සඳහා සංශෝධිතාකාරයෙන් ඉදිරිපත් කරන ලදුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

## 06. රීති අංක 107 යටතේ යෝජනාව :

මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

## 07. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : පළාත් පාලන ආයතනවල බලතල පවරා ගැනීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියේ තීරණය ප්‍රතික්ෂේප කිරීම.

මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"නාගරික සංවර්ධන අධිකාරිය විසින් පළාත් පාලන ආයතන වෙත 1985 මාර්තු මස 01 වන දින සිට පවරා දී තිබූ බලතල හා ක්‍රියාකාරකම්වලින් වැඩි කොටසක් මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති නාගරික සංවර්ධන අධිකාරියේ අංක DDG(P)01/11 සහ 2017 ජනවාරි මස 23 වන දිනැති ලිපිය මගින් ආපසු පවරා ගැනීමට කටයුතු කර ඇත. බලතල ආපසු පවරා ගැනීම සිදු කිරීමට කටයුතු කර ඇත්තේ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන් නොමැති අවස්ථාවකය. මෙමඟින් අදාළ ප්‍රදේශයේ ජනතාවට පළාත් පාලන ආයතනයකින් සේවය ලබා ගැනීමට තිබූ පහසු හැකියාව නැති වන අතර, එය පළාත් පාලන ආයතනවල ආදායම් අඩු වීමට ද හේතුවක් වනු ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලය බෙදීමේ මූලික සිද්ධාන්තය පිළිගෙන ඇති අතර, දශක තුනකට ආසන්න කාලයක් ඒ අනුව ක්‍රියාත්මක වී ඇත.*

*බලය බෙදීමේ මූලික සිද්ධාන්තයට පටහැනි ඉහතින් සඳහන් කරන්නට යෙදුනු නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ අංක DDG(P)01/11 සහ 2017 ජනවාරි මස 23 වන දිනැති ලිපියෙන් දැනුම් දී ඇති එම අධිකාරියේ තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අරමුණට පටහැනි බැවින් එය ප්‍රතික්ෂේප කළ යුතු බැව් මෙම සභාව යෝජනා කරන්නීය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා. 11.09 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ යසපාල කෝරළගේ මහතා ] මූලාසනාරූඪ විය.***

***අ.භා. 01.25 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 08. කල් තැබීම :

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 02.32 ට, 2017 පෙබරවාරි මස 21 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.02.07
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/07
Minuts 2017.02.07- Hansard Section